ඇමුණුම (ආ)

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය - කාර්ය සාධන වාර්තාව 2017

ආයතනයේ වැඩකටයුතු පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය, බලශක්ති කළමනාකරණය සහ බලශක්ති තොරතුරු සහ දැනුවත් කිරීම යන ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ සිදුකරනු ලබන අතර, එක් එක් ක්ෂේත්‍රයේ වැඩකටයුතුවල සාරාංශය පහත දැක්වේ.

1. **පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය**

- සුනිත්‍ය බලශක්තිය භාවිතයෙන් උපදවා ගන්නා මුළු විදුලිය 1,715 GWh කි. ව්‍යාපෘති 219 ක් ඇත.
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සඳහා අනුමැතිය ලබාදීමේ ක්‍රමවේදය යටතේ, තාවකාලික අනුමැතිය (PA) සහ බලශක්ති බලපත්‍රය (EP) නිකුත් කරන ලද සියලුම ව්‍යාපෘතිවල ප්‍රගතිය කාර්තුමය වශයෙන් අධීක්ෂණය කර ගැටළු විසඳීමට සහාය ලබා දේ.
- පුනර්ජනනීය බලශක්ති සංවර්ධන සැලැස්මක් නිර්මාණය කිරීම සඳහා සූර්ය, සුළං, කුඩා ජලවිදුලි, ජෛව ස්කන්ධ, තරංග බලශක්තිය වැනි බලශක්ති මූලාශ්‍ර අධ්‍යයනයන් සිදු කෙරේ. මීට අමතරව, බලශක්ති ගබඩා පද්ධති වැනි නව තාක්ෂණයන් සම්බන්ධ තාක්ෂණික ඇගයීම් සිදු කරනු ලැබේ.

පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය සම්බන්ධ ව්‍යාපෘති පහත දැක්වේ.

1.1 ආසියානු සංර්ධන බැංකුවේ සහයෝගයෙන් සූර්ය පියැසි පද්ධති ප්‍රවර්ධනය

මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය ශ්‍රී ලංකාවේ සූර්ය කෝෂ පදනම් කරගත් විදුලි උත්පාදනය උත්ප්‍රේරණය කිරීම සහ ප්‍රචලිත කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල සූර්ය විදුලි නියමු ව්‍යාපෘති ක්‍රියාත්මක කරයි. රාජ්‍ය අංශයේ සංරචකය හරහා විශ්වවිද්‍යාලවල ඉංජිනේරු පීඨයන් වෙත අවධානය යොමු කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ.

- ✓ පේරාදෙණිය විශ්ව විද්‍යාලය**,** මොරටුව විශ්ව විද්‍යාලය**,** රුහුණු විශ්ව විද්‍යාලය සහ යාපනය විශ්ව විද්‍යාලය තුළ සූර්ය පැනල පද්ධති හතරක් සවි කිරීම හරහා ජාතික විදුලිබල පද්ධතියට 200 kWසම්බන්ධ කරන ලදී.
- ✓ පුද්ගලික අංශයේ ආයතනවල සූර්ය විදුලි පද්ධති 22 ක් සවි කර ඒ හරහා, 1800 kW ජාතික විදුලිබල පද්ධතියට එකතු කර ඇත.

1.2 සූර්ය බල සංග්‍රාමය

- ✓ සූර්ය බලශක්ති සේවා සපයන්නන් 296 ක් 2017 වසර අවසන් වන විට සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ලියාපදිංචි වී ඇත.
- ✓ පද්ධතියට 270 kW එකතු කරමින් සූර්ය විදුලි පද්ධති 135 ක් "රිවි අරුණ" යටතේ ආගමික ස්ථානවල සවිකරන ලදී.

- ✓ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය සමග එක්ව සූර්ය විදුලි පද්ධති සම්බන්ධයෙන් ප්‍රමිති දාහතක් ප්‍රකාශයට පත්කරන ලදී. තාක්ෂණික වැඩමුළු තුනක් සහ සේවා සපයන්නන් සඳහා එක් වැඩමුළුවක් පවත්වන ලදී.
- ✓ මෙම වැඩසටහන යටතේ මෙගා වොට් 100 සන්ධිස්ථානය අත්කරගැනීම අතිගරු ජනාධිපතිතුමා සහභාගී වූ උත්වයකදී සනිටුහන් කරන ලදී.

1.3 සුළං බලශක්ති මිණුම්ගත කිරීම

- ✓ බලන්ගොඩ, සීතාඑළිය, කලමැටිය, මුල්ලිපුරම, සිලාවතුර, නාඩුකුඩා, පොන්නලෙයි, පූනරීන් සහ කෝකිලායි වෙරළේ සුළං කුළුණුවල දත්ත එකතු කිරීම කරගෙන යනු ලැබේ.
- ✓ සම්පත් සිතියම්ගතකිරීම කරගෙන යනු ලැබේ. සීතාඑළිය, පුත්තලම, සූරියකන්ද, යාපනය සහ පූනරීන් යන ස්ථානවල දළ සිතියම් සකස් කරන ලදී.

1.4 සහායක විදුලි සැපයුම් විශ්වසනීයත්වයෙන් ක්‍රියාත්මක කිරිමේ ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ උතුරු පළාතේ, නයිනතිවු, අනලතිවු සහ ඩෙල්ෆ් යන දූපත්වල ජනතාවගේ ජීවනෝපායන් වැඩිදියුණු කිරීම සඳහා සූර්ය බලශක්තිය යොදා ගැනීම සිදු කෙරේ.

1.5 තිරසාර ජෛව ස්කන්ධ බලශක්ති නිෂ්පාදනය සහ නවීන ජෛව බලශක්ති තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම '

- ✓ මෙම ව්‍යාපෘතිය යටතේ හෝමාගම ප්‍රදේශයෙහි ඉන්ධන දැව ගබඩාවක් පිහිටුවීම 2017 දී අවසන් කරන ලදී. මොණරාගල සහ කුරුණෑගල තවත් පර්යන්ත දෙකක් පිහිටුවීමේ කටයුතු ආරම්භ කරන ලදී. මහා පරිමාණ කර්මාන්ත හා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ජෛව ස්කන්ධ බලශක්ති ව්‍යාපෘති 24 ක් ක්‍රියාත්මක කරන ලදී.
- ✓ බිම් මට්ටමේ වගාකරුවන්ගේ ප්‍රයෝජනය සඳහා ඉන්ධන දැව වගාකිරීමේ අත්පොතක් ප්‍රකාශයට පත් කරන ලදී.
- ✓ පොල් වගා කිරීමේ මණ්ඩලය සමඟ හෙක්ටයාර 600 ක ඉන්ධන දැව වගාව සඳහා මූලික කටයුතු සිදු කරන ලදී.
- ✓ තේ කර්මාන්තශාලා නිලධාරීන් සඳහා ජෛව ස්කන්ධ තාක්ෂණයන් සම්බන්ධව පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී.

1.6 ශ්‍රී ලංකාවේ බලශක්ති උත්පාදන හා අවසන් භාවිත අංශවල අවම කිරීමේ සුදුසු ක්‍රියාමාර්ග

- ✓ බලශක්ති කාර්යක්ෂමතාවයෙන් ඉහළ මොටර් හඳුන්වා දීම, සූර්ය විදුලි පද්ධති සවි කිරීම සහ ජීව වායු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම 2017 වසරේදී ආරම්භ කරන ලදී.
- ✓ බලශක්ති ක්ෂේත්‍රය සඳහා තාක්ෂණ විශේෂිත විමෝචන පිරිවැය වක්‍රය (MAC Curve) නිර්මාණය කිරීම තුළ විමෝචන අඩුකිරීම් සම්බන්ධව වැඩමුළුවක් පැවැත්වීම සිදු කරන ලදී.
- ✓ ජීව වායු වායු පද්ධති 40 ක් ස්ථාපනය කිරීම සහ තේ කර්මාන්තශාලා වල මෝටර් සඳහා විචල්‍ය සංඛ්‍යාත පද්ධති (VFDs) ස්ථාපනය කිරීම සිදු කරන ලදී.

- ✓ ජීව වායුව පද්ධති ස්ථාපනය කිරීමේදී තත්ත්ව පාලනය පිළිබඳ වැඩමුළු පහක් පළාත් සභාවලදී පැවැත්විණි.

1.7 පූනරින් සුළං - සූර්ය උද්‍යානය

ශ්‍රී ලංකාවේ සුළං සහිත ප්‍රදේශවල වර්ග කිලෝමීටර් 5,000 කට ආසන්න ප්‍රමාණයක් හොඳ තත්වයේ සිට විශිෂ්ට විශිෂ්ඨ තත්වය දක්වා සුළං සම්පත් විභවයක් ඇති බවට ගණන් බලා තිබේ. පූනරින් යනු මෙගාවොට් 100 ට වැඩි සුළං සඳහා විභවයක් ඇති බව හඳුනාගෙන ඇති ප්‍රධාන ස්ථානයකි. පූනරින් සුළං-සූර්ය උද්‍යානය සම්බන්ධ පහත භූමි ප්‍රදේශ මිණුම්ගත කරනු ලැබේ.

1) පූනරින් බිම් තීරුවේ නැගෙනහිර හා බටහිර වෙරළ තීරයේ මීටර් 200 ක් පළල සුළං විභවයක් සහිත වෙරළබඩ බිම් තීරය.
2) යෝජිත මෙගාවොට් 2 x 100 සූර්ය බලශක්ති බලාගාර සඳහා අවශ්‍ය භූමි ප්‍රමාණය.

1.8 සූර්ය බලශක්ති සම්බන්ධ පර්යේෂණ

- ✓ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ විදුලි හා විද්‍යුත් ඉංජිනේරු අංශය සමඟ සහයෝගයෙන් මහා පරිමාණ සූර්ය බලශක්ති සංවර්ධනයේ තාක්ෂණික මැදිහත්වීම්වලට අදාළ උසස් පර්යේෂණ ව්‍යාපෘති දෙකෙහි මුල් වසරේ වැඩකටයුතු සාර්ථකව නිම කරන ලදී.
    - ශ්‍රී ලංකාවේ PV විශාල වශයෙන් යෙදවීමත් සමඟ සැපයුමේ ආරක්ෂාව
    - DC ක්ෂේත්‍ර ජාලයක් හරහා PV බලශක්ති කාර්යක්ෂමව භාවිතා කිරීම

2. බලශක්ති කළමනාකරණය

2.1 බලශක්ති කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම

- ✓ ISO 50001 බලශක්ති කළමනාකරණ පද්ධති හඳුන්වාදීම තුළින් කාර්මික හා වාණිජ අංශවල බලශක්ති සංරක්ෂණයට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පහසුකම් සපයයි.
- ✓ බලශක්ති කළමනාකරුවන් 205 ක් සහ බලශක්ති විගණකවරුන් 16 දෙනෙකු ප්‍රතීතනය කරනු ලැබීය. ජනාධිපති ලේකම් කාර්යාලය මගින් නිකුත් කරන ලද එස්පී / පීසීඑම්ඩී / 6/2015 චක්‍රලේඛයට අනුව රාජ්‍ය අංශයේ බලශක්ති කළමනාකරණ නිලධාරීන් 150 ක් පමණ පත් කරන ලදී.

2.2 ප්‍රමිතීන් සහ රෙගුලාසි හඳුන්වාදීම

- ✓ සුසංහිත ප්‍රතිදීප්ත පහන් (CFL)බලශක්ති ලේබලය සම්බන්ධ සංශෝධිත ප්‍රමිතිය ප්‍රකාශයට පත් කරන ලදී. සංශෝධිත ප්‍රමිතිය සඳහා වන රෙගුලාසිය සකස් කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවන ලදි.
- ✓ වායු සමීකරණ යන්ත්‍ර - බලශක්ති ලේබල් කිරීමේ ප්‍රමිතිය කෙටුම්පත් කර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට යවන ලදි. ළඟදීම ප්‍රකාශයට පත් කිරීමට නියමිතයි.

- ✓ ශීතකරණ - වෙනත් රටවලින් සමාන ප්‍රමිති ලබා ගෙන නව ප්‍රමිතියක් සම්පාදනය කිරීම ආරම්භ කරන ලදී. පූර්ණ පරිමාණයේ බලශක්ති ලේබල් කිරීමට උත්සාහ කිරීමට පෙර, ශීතකරණ සඳහා අවම බලශක්ති කාර්ය සාධන ප්‍රමිතීන් (MEPS) සකස් කරනු ලැබේ.
- ✓ LED ලාම්පු - LED ලාම්පු සඳහා ස්වේච්ඡා බලශක්ති ලේබලය ක්‍රියාත්මක කරන ලදී. අනිවාර්ය පදනමක් මත මෙම වැඩසටහන ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා වන කෙටුම්පත් රෙගුලාසි ළඟදීම නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවනු ලැබේ.
- ✓ පරිගණක - බලශක්ති ලේබල් කිරීමේ ප්‍රමිතිය කෙටුම්පත් කර ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට යවන ලදි. ළඟදීම ප්‍රකාශයට පත් කිරීමට නියමිතයි.
- ✓ සීලිං පංකා - පරීක්ෂණාගාර උපකරණ මිල දී ගෙන ඇති අතර පරීක්ෂණාගාරය ස්ථාපනය කරමින් පවතී.

- ✓ බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි පිළිබඳ සංශෝධිත පිළිවෙත් මාර්ගෝපදේශ සංග්‍රහය බලාත්මක කිරීමේ රෙගුලාසියක් කෙටුම්පත් කරන ලදී. කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා ගොඩනැගිලි ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් ඇතුළුව සම්පූර්ණ ක්‍රියාත්මක කිරීමේ යෝජනා ක්‍රමයක් සකස් කරන ලදී.
- ✓ ශ්‍රී ලංකාවේ තිරසාර බලශක්ති වාසස්ථාන සඳහා වූ මාර්ගෝපදේශය භාෂා තුනෙන්ම පූර්ව මාධ්‍ය මට්ටමට සකස් කරන ලදී.

2.3 උපදේශන සේවා

- ✓ ISO 50001 විගණන ආයතන 8 ක් තුළ සිදු කරන ලදී.
- ✓ බලශක්ති සේවා සමාගම් (ESCO) 44 ක් බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම (EEI), බලශක්ති විගණන සේවය (EAS) සහ තාක්ෂණ සැපයුම්කරුවන් (TP) යන කාණ්ඩ යටතේ ලියාපදිංචි කර ඇති අතර යාවත්කාලීන කරන ලද ESCO ලැයිස්තුව වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කෙරේ.
- ✓ කළුතර එස්.ටී.එෆ් පුහුණු පාසල තුළ ප්‍රාථමික බලශක්ති විගණනයක් සිදු කරන ලදී.
- ✓ වයඹ පළාතේ ස්වාධීන රූපවාහිනිය, වයඹ පළාතේ යන්ත්‍රෝපකරණ හා උපකරණ අධිකාරිය යන ආයතනවල සවිස්තරාත්මක බලශක්ති විගණනයන් සිදු කරන ලදී.
- ✓ UCSC (කොළඹ විශ්ව විද්‍යාලය) හි සවිස්තරාත්මක බලශක්ති විගණනයක් සිදු කරමින් පවතී.
- ✓ කොළඹ ආරක්ෂක පාසලේ, පැලවත්ත සහ සෙවනගල සීනි කර්මාන්තශාලාවල සවිස්තරාත්මක බලශක්ති විගණනයන් සිදුකිරීම සඳහා උපදේශන සේවා, පුහුණුව සහ තාක්ෂණික සහාය ලබා දෙන ලදී.
- ✓ තෝරාගත් බලශක්ති සේවා සමාගම් 4 ක් විසින් මධ්‍යම පළාතේ රජයේ ආයතනවල බලශක්ති විගණන 10 ක් සිදු කරන ලදී .
- ✓ රජයේ රෝහල්වල සහ ආයතනවල සවිස්තරාත්මක බලශක්ති විගණන 16 ක් පැවැත්වීම සඳහා සුදුසු බලශක්ති සේවා සමාගම් තෝරා ගැනීම සඳහා ටෙන්ඩර් ඇගයීම සිදු කරමින් පවතී.
- ✓ උපකරණ-දින ගණන 1,200 ක් වන ලෙස බලශක්ති මිනුම් උපකරණ සේවා සැපයීම් සිදුකරන ලදී.

2.4 බලශක්ති සංරක්ෂණය සඳහා දායකත්වය ඇගයීම

- ✓ නව තාක්‍ෂණයන් හඳුන්වාදීම සහ දැනුම බෙදා හැරීම අරමුණු කරගනිමින් 'විදුල්කා' බලශක්ති ප්‍රදර්ශනය පැවැත්වීම තුළින් ජාතික මට්ටමේ ප්‍රවර්ධන කටයුතුවලට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සම්බන්ධ වේ. බලශක්ති සංරක්ෂණයට අදාළ නිෂ්පාදන හා සේවාවන් ප්‍රවර්ධනය කිරීම සඳහා බලශක්ති අංශයේ සංවිධාන, උපකරණ සැපයුම්කරුවන්, නිෂ්පාදකයින්, නවෝත්පාදකයින් සහ අධ්‍යාපන කටයුතුවල නියුතු වූවන්ට එමඟින් සුවිශේෂී අවස්ථාවක් සැළසේ.
- ✓ විදුල්කා ජාතික බලශක්ති ප්‍රදර්ශනය 2017 නොවැම්බර් 18 සිට 20 දක්වා BMICH හිදී පැවැත්විණි. බලශක්ති ප්‍රදර්ශනය පුනර්ජනනීය බලශක්ති තාක්ෂණයන්, බලශක්ති කළමනාකරණය සහ නව නිපැයුම් ඇතුළත් වාණිජ හා ආයතනික කුටි හැටකින් සමන්විත වූ අතර සාමාන්‍ය ජනතාවට තාක්ෂණයන්, නිෂ්පාදන, සේවා පිළිබඳ තොරතුරු සපයන ලදී.

2.5 ආංශික විශේෂිත බලශක්ති කළමනාකරණ වැඩසටහන්

- ✓ පළාත් මට්ටමින් බලශක්ති කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් සහාය දක්වනු ලැබේ. තේ කර්මාන්තශාලා කළමනාකරුවන් සහ කර්මාන්තශාලා නිලධාරීන් 60 දෙනෙකු සඳහා දකුණු හා මධ්‍යම පළාත්වල බලශක්ති කළමනාකරණය පිළිබඳ වැඩසටහන් දෙකක් පවත්වන ලදී. තෝරාගත් පුහුණු ආයතනයක් (SLEMA) විසින් වැඩසටහන පවත්වන ලදී.

2.6 බලශක්ති සංරක්ෂණය සම්බන්ධ පර්යේෂණ හා සංවර්ධන

ශ්‍රී ලංකාවේ බලශක්ති කළමනාකරණ භාවිතයන් වැඩිදියුණු කිරීම සඳහා නව හා නව්‍ය තාක්‍ෂණයන් අනුගමනය කිරීමේ හැකියාව ගවේෂණය කිරීම සඳහා මුල පිරීම් සිදු කෙරේ. බලශක්ති කාර්ය සාධනය නිවැරදිව තක්සේරු කිරීමට උපකාරී වන තේ පර්යේෂණ ආයතනයේ (TRI) සහාය ඇතිව නවීකරණය කරන ලද නල, රේඩියේටර්, ක්‍රියාවලි පාලනය සහ පැතිරීමේ යාන්ත්‍රණය ඇතුළත් තේ වියලීමේ ආකෘතියක් නිර්මාණය කර ඇත. ඒ සම්බන්ධව ඉදිරි වැඩකටයුතුවලට අදාළව අවබෝධතා ගිවිසුම තේ පර්යේෂණ ආයතනය සමඟ අත්සන් කිරීමට සූදානම් කර ඇත.

2.7 බලශක්ති සංරක්ෂණය සම්බන්ධ නියාමන ව්‍යාපෘති

ත්‍රි-උත්පාදනය හෙවත් ඒකාබද්ධ සිසිලන තාපය සහ බලය (CCHP) යනු එක් ශක්ති ප්‍රභවයකින් එකවර විදුලිය උත්පාදනය කිරීම ප්‍රයෝජනවත් උණුසුම සහ සිසිලනය ලැබෙන ක්‍රමයක් අතර, එය උපරිම බලශක්ති භාවිතය සඳහා ලබා ගත හැකි හොඳම ක්‍රමයක් වේ. එමගින් 80% ට වඩා කාර්යක්ෂමතාව ළඟා කර ගත හැකිය. මෙම සන්දර්භය තුළ, හෝටල්, රෙදිපිළි හා ඇඟලුම් වැනි අංශ සහ කාර්මික කලාප සඳහා ත්‍රි-උත්පාදනය හඳුන්වා දීමේ හැකියාව ගවේෂණය කෙරේ. යෝජනා තෝරා ගැනීම සඳහා අවසාන ඇගයීම සිදු වෙමින් පවතී.

2.8 ඉල්ලුම පාර්ශව කළමනාකරණ (ODSM) වැඩසටහන

- ✓ කාර්යක්ෂම වායු සමීකරණ යන්ත්‍ර - විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය හරහා වායු සමීකරණ යන්ත්‍ර කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා චක්‍රලේඛයක් නිකුත් කරන ලදී. රාජ්‍ය අංශයේ බලශක්ති කළමනාකරණ නිලධාරීන් අතර දැනුවත්භාවය ඇති කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් දෙකක් පවත්වන ලදී.
- ✓ කාර්යක්ෂම ශීතකරණ යන්ත්‍ර - 'ශ්‍රී ලංකා වෙළඳපොළෙන් අකාර්යක්ෂම ශීතකරණ ඉවත් කිරීම' පිළිබඳ කෙටුම්පත් රෙගුලාසියක් සකස් වෙමින් පවතී. එය වැඩසටහනේ පාර්ශවකරුවන් විසින් සමාලෝචනය කරනු ලැබේ.
- ✓ අකාර්යක්ෂම ශීතකරණ වෙනුවට කාර්යක්ෂම ශීතකරණ ආදේශ කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් වෙමින් පවතී.
- ✓ කාර්යක්ෂම ශීත කිරීමේ උපකරණ - 2017 මැයි 31 වන දින ESCO සඳහා රැස්වීමක් පවත්වන ලදී. ශීත කිරීමේ උපකරණ පිළිබඳ දත්ත එක්රැස් කිරීම සිදු කෙරෙමින් පවතී. වැඩසටහන සඳහා ක්‍රමවේදයක් සැකසීම සඳහා ඔවුන්ගේ නිෂ්පාදන ලබා ගැනීමට ටෙක්සෝල් (පුද්ගලික) සහ CBL හි ඉංජිනේරුවන් සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී.
- ✓ කාර්යක්ෂම මෝටර් - මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්ත කිහිපයක් LECO ප්‍රදේශයෙන් තෝරා ගන්නා ලදී. කර්මාන්ත 50 කින් සමන්විත සමූහයක සමීක්ෂණයක් පැවැත්වීමට සැලසුම් කර ඇත.
- ✓ තාප දීප්ත ලාම්පු ඉවත් කිරීම - 'ශක්ති' නමින් LED ලාම්පු බෙදා හැරීමේ වැඩසටහන සැළසුම් කර ඇත. මෙම වැඩසටහනේ ඉලක්ක කණ්ඩායම වන්නේ 2017 දී සාමාන්‍ය මාසික විදුලි පරිභෝජනය 90 kWh ට අඩු ගෘහස්ත පාරිභෝගිකයින්ය. සුදුසුකම් ලත් පාරිභෝගිකයින් සඳහා LED විදුලි පහන් මිලියන 10 ක් CEB, LECO නියෝජිතයින් හරහා බෙදා හැරීමට යෝජනා කෙරේ. බල්බවල පිරිවැය පොළියකින් තොරව මාස 24 ක් තුළ වාරික වශයෙන් අයකර ගනු ලැබේ. තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලිය තුළින් සුදුසු LED සැපයුම්කරුවෙකු තෝරා ගැනීම පිළිබඳව නිගමනයකට එළඹ තිබේ. අධීක්ෂණය, ඉතිරිකිරීම් ගණනය කිරීම්, අක්‍රිය වන LED ප්‍රතිස්ථාපනය සහ පශ්චාත් ඇගයීම සඳහා සහභාගී වූ ගිණුම් හිමියන්, ආපසු එන තාපදීප්ත බල්බ සහ බෙදා හරින ලද සුදුසු LED පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම අවශ්‍ය වේ. ඇන්ඩ්‍රොයිඩ් ඇප් සහ අතින් ගෙන යා හැකි උපාංග සහ ලේඛන සඳහා අවශ්‍ය මෘදුකාංග ඇතුළුව බල්බ බෙදා හැරීමේ වැඩසටහන සම්පූර්ණයෙන්ම සැළසුම් කර ඇත.
- ✓ හරිත ගොඩනැගීලි - බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි පිළිබඳ සංශෝධිත මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව ගොඩනැගිලි ශ්‍රේණිගත කිරීමේ ක්‍රමයක් ඇතුළුව සම්පූර්ණ ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය සකස් කරන ලදී. තෝරාගත් රජයේ ගොඩනැගිලිවල සූර්ය පියැසි පද්ධති සවි කිරීම සඳහා රුපියල් මිලියන 350 ක් බෙදා හැරීමේ වැඩසටහනක් සකස් කරන ලද අතර භූගෝලීය ප්‍රදේශ හතක් සහ සේවා සපයන්නන් සිව් දෙනෙකු සම්බන්ධ කර ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කරන ලදී.
- ✓ සුහුරු නිවාස - ශ්‍රී ලංකාවේ තිරසාර බලශක්ති පදිංචි ස්ථාන සඳහා වූ මාර්ගෝපදේශය භාෂා තුනෙන්ම පූර්ව මාධ්‍ය මට්ටමට සකස් කරන ලදී. මිලියන 1,500 ක් වෙන් කිරීම උපයෝගී කරගනිමින් සූර්ය පියැසි පද්ධති වැඩ සටහන 'සූර්යබල සංග්‍රාමය' ප්‍රවර්ධනය කිරීම සඳහා

මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. 2017 වසර අවසන් වන විට බැංකු 12 ක් ක්‍රියාකාරීව නිරත වී ඇත.

3. බලශක්ති තොරතුරු හා දැනුවත් කිරීම

3.1 බලශක්ති තොරතුරු විශ්ලේෂණය

- ✓ ශ්‍රී ලංකා බලශක්ති තුලනය 2016 සම්පාදනය කර මුද්‍රණය කෙරෙමින් පවතී. 2016 දත්ත සමඟ වෙබ් අඩවිය යාවත්කාලීන කරන ලදී.
- ✓ අවසාන පරිශීලක බලශක්ති පරිභෝජන සිදු කරන ලදී.
- ✓ දිවයින පුරා ඉන්ධන පිරවුම්හල් සමීක්ෂණය සඳහා සමීක්ෂණ සැලැස්ම ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සමඟ සකස් කරන ලදී. වාර්තාව සම්පාදනය වෙමින් පවතී.

3.2 ජාතික බලශක්ති සම්මන්ත්‍රණය

- ✓ ජාතික බලශක්ති සම්මන්ත්‍රණය 2017 නොවැම්බර් 19 සහ 20 දිනවල පවත්වන ලදී. බලශක්ති කාර්යක්ෂමතාව සහ පුනර්ජනනීය බලශක්තිය යන තේමාවන් දෙක යටතේ පර්යේෂණ පත්‍රිකා 25 ක් ඉදිරිපත් කරන ලදී. මෙම ක්ෂේත්‍රවල ජාතික වැඩසටහන් සඳහා පර්යේෂණ හා සංවර්ධන යෙදවුම් ලබා ගැනීමේ ක්‍රමවේදයන් ප්‍රතිපත්ති සම්පාදකයින්, පර්යේෂකයින්, කර්මාන්තකරුවන් සහ අධ්‍යාපනවේදීන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡා කෙරිණි. 'ජෛව ස්කන්ධ ශක්තිය පිළිබඳ ජාතික නවෝත්පාදන සැසිය මගින් ජෛව ස්කන්ධ අංශයට අදාළ නව සොයාගැනීම් ඇගයීමට ලක් කරන ලදී.

3.3 බලශක්ති අධ්‍යාපන වැඩසටහන සංවර්ධනය කිරීම

- ✓ බලශක්ති අධ්‍යාපන වැඩසටහනේ ප්‍රධාන වැඩසටහන පාසල් බලශක්ති සමාජ වැඩසටහනයි. ඒ සම්බන්ධයෙන් උනන්දුව දක්වන දිවයිනේ සෑම පාසලක්ම ආවරණය වන පරිදි සමාජ ශාලා 3,000 ක් පිහිටුවා ඇත.
- ✓ පාසල් බලශක්ති සමාජ සම්මාන - 2016 උත්සවය සාර්ථක ලෙස BMICH හිදී 2017 දෙසැම්බර් 28 දින සම්භාවනීය අමුත්තන් පිරිසකගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.
- ✓ නව නිපැයුම්, ප්‍රදර්ශන, ව්‍යාපෘති, පර්යේෂණ, සමීක්ෂණ, ඩිජිටල් පෝස්ටර්, කෙටි චිත්‍රපට, නාට්‍ය හා විවාද සඳහා බලශක්ති සම්බන්ධ නව්‍ය ප්‍රවේශයන් භාවිතා කිරීම, ප්‍රවර්ධනය කිරීම සඳහා කැපී පෙනෙන දායකත්වයක් පෙන්වූ සිසුන්ට මුදල් ත්‍යාග සහ සහතික පිරිනමන ලදී.
- ✓ පළාත් නවය ආවරණය වන පරිදි රජයේ පාසල් 88 කින් සිසුන් 550 ක් සඳහා සම්මාන ප්‍රදානය කරන ලදී. වැඩසටහන කෙරෙහි ඔවුන් දක්වන කැපවීම අගය කිරීම වෙනුවෙන් පළාත් නවයේ හොඳම බලශක්ති ගුරුවරයා, සේවා නිලධාරී සහ නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත තවත් සම්මාන පිරිනමන ලදී.

3.4 සන්නිවේදන වැඩසටහන්

- ✓ ජනාධිපති ලේකම් කාර්යාලය විසින් BMICH හි දී පවත්වන ලද 'තිරසර ලංකා' ප්‍රදර්ශනයට සහ ත්‍රිකුණාමලයේ ජාතික තරුණ ප්‍රදර්ශනයට සහභාගී විය.
- ✓ පාසැල් ප්‍රදර්ශන 7කට සහභාගි විය.
- ✓ බලශක්ති මාධ්‍යවේදී සම්මාන සඳහා මාධ්‍ය මාර්ගෝපදේශය දැනටමත් කැළණිය විශ්ව විද්‍යාලයේ ජන සන්නිවේදන අංශය විසින් සකස් කර ඇති අතර ජනමාධ්‍ය ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.
- ✓ කෑගල්ලේදී පවත්වන ලද පරිසර දින වැඩසටහන සංවිධානය කර ඒ සඳහා සහභාගී විය.

3.5 ජනමාධ්‍ය වැඩසටහන්

- ✓ ජනමාධ්‍යවේදීන් සඳහා බලශක්ති හා පරිසර පාඨමාලාවේ පළමු අදියර නිම කරන ලද අතර සාර්ථකව නිම කළ මාධ්‍යවේදීන් 17 දෙනෙකු සඳහා තිළිණ සහතිකපත් ලබා දෙන ලදී. වැඩසටහනේ දෙවන අදියර 2017 මැයි මස 3 වන දින BMICH හිදී ආරම්භ කරන ලදී. මාධ්‍යවේදීන් පහළොස් දෙනෙකු පුහුණු කරනු ලබන අතර එය 2018 අප්‍රේල් මාසයේදී අවසන් වේ.
- ✓ බලශක්තිය සංරක්ෂණය සම්බන්ධයෙන් නවලිය පුවත්පතේ ලිපි මාලාවක් පළ කර ඇත.
- ✓ සූර්ය බලශක්ති පිළිබඳ ලිපි මාලාවක් 'විදුසර' පුවත්පතේ පළ කර ඇත.

විගණන විමසුම් හා විගණන වාර්තාවල අඩංගු අඩුපාඩු නිවැරදි කර ගැනීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග-2018.10.17 දින විගණකාධිපති වාර්තාව

විගණන යොමු අංකය	2017 විගණන වාර්තාව අනුව දක්වා ඇති කරුණු	ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග
2 2.1	**මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම** 2017 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2018 අගෝස්තු 30 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	2017 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර විගණනය වෙත ඉදිරිපත් කර ඇත.
2.3	**ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්** (අ)RCL මධ්‍යස්ථානය වෙනුවෙන් විදුලිබල මණ්ඩලයෙන් අය විය යුතු රු. 8,033,270 ක මුදල 2018 අගෝස්තු 30 දින දක්වාම අය කර ගෙන නොතිබුණි.	මෙම හිඟ මුදල අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේ දී ලංකා විදුලි බල මණ්ඩලය විසින් ගෙවීමට එකඟ විය.
2.4	**නීතිරීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම** (අ)කාර්යාල ගොඩනැගිල්ලක් ඉදි කිරීම සඳහා ඉඩමක් මිලදී ගැනීමට හා එම ගොඩනැගිල්ලෙහි සැලසුම් සකස් කිරීම සඳහා 2015, 2016 හා 2017 යන වර්ෂ වලදී එකතුව රු.54,263,517 ක් අධිකාරිය විසින් එම අරමුදලේ ආයෝජන වලින් ඉවත්කර ගෙන තිබුණි.	ඉඩම මිලදී ගැනීම වෙනුවෙන් රු. 54,263,517/= ක් ආයතනයේ මුදලින් දැරූ නමුත් ඉදිරියේ දී ADB ආයතනය සමග මෙම ව්‍යාපෘතිය කිරීමේදී මෙම මුදල ප්‍රතිපූර්ණය කිරීමට බලාපොරොත්තු වේ.
	(ආ)(i) බඩු ලේඛන පොත් පවත්වා නොතිබුණි.	බඩු ලේඛන පොත් පවත්වාගෙන යනු ලැබේ.
	(ii) වත්කම් භෞතික සත්‍යාපනය කර නොතිබුණි.	2017 වර්ෂය සඳහා වත්කම් භෞතික සත්‍යාපනය මේ වනවිට නිම කර ඇත.
	(ඇ) (i) ස්ථාවර වත්කම් ලේඛනයක් චක්‍රලේඛය ප්‍රකාරව පවත්වා නොතිබුණි.	මෙය 2018 දී නිවැරදි කිරීමට හැකි වනු ඇත.
	(ii) පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන නොතිබුණි	පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛන පවත්වාගෙන තිබේ.
	(ඇ)කළමනාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව අධිකාරියේ ඉංජිනේරු තනතුර දරන නිලධාරීන් සඳහා 2016 අගෝස්තු සිට 2018 මැයි දක්වා රු.7,980,000 ක මුදලක් වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත වෘත්තීය දීමනා ගෙවීමේ ඉල්ලීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. එනමුදු මේ සඳහා විධිමත් අනුමැතියක් මේ දක්වා ලබාදී නොමැති අතර, ඒ ගැන සලකා බලා පිළිතුරක් ලබාදෙන බව කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් දන්වා එවා ඇත.
2.5	**ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු** (අ) "ස්විච් - ඒෂියා"වැඩ සටහන යටතේ යුරෝපා සංගමයෙන් ලැබී තිබුණු රු. 7,334,354 ක මුදලින් රු. 3,135,202 ක්, 2010 හා 2011	මේ පිළිබඳ අනුමැතිය ඉල්ලා භාණ්ඩාගාරය වෙත අවස්ථා කිහිපයකදී අමාත්‍යාංශ ලේකම් හරහා ලිපි යොමු කර ඇත. තවද මේ පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් 2017

	වර්ෂයන්හි දී අධිකාරියේ සියලු නිලධාරීන් සඳහා වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි. නීත්‍යානුකූල නොවන මෙම ගෙවීම අදාල නිලධාරීන්ගෙන් හෝ ඊට වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීමට අමාත්‍යාංශයේ ලේකම් විසින් 2012 දෙසැම්බර් 03 දින දෙන ලද නියෝගය 2017 සැප්තැම්බර් 30 දක්වාම ඉටු කර ගෙන නොතිබුණි.	නොවැම්බර් 06 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
	(ආ)වසරක කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නව අධ්‍යක්ෂ ජනරාල්වරයාට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව මාසිකව රු. 250,000 ක වැටුපක් ගෙවා තිබුනද මෙතෙක් එම තනතුර සඳහා ගෙවීම් කර තිබුනේ රු. 98,215 කි.	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට යටත්ව අදාළ වැටුප් ගෙවීම තීරණය කර ඇත. එසේ වුවද දෙවන වර දීර්ඝ කිරීම සඳහා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇත.
3.1.1	**<u>මෙහෙයුම් සමාලෝචනය</u>** **<u>කාර්යසාධනය</u>** (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය ප්‍රකාරව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	2015 - 2025 සඳහා දස වසරක සැලැස්මක් ආයතනය විසින් සම්පාදනය කර ඇත. රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2014 මඟින් ආයතනය සඳහා සංයුක්ත සැලැස්මක් අවශ්‍ය නොවන බව නිගමනය කරන ලදී.
	(ආ)වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය සමාලෝචනය කර සමාලෝචිත වර්ෂය අවසානයට වාර්තාවක් සකස්කර නොතිබුණි.	2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය කර අදාළ වාර්තාව සම්පාදනය කර ඇති අතර, වාර්ෂික මහ බැංකු වාර්තාව සඳහා පාදක කර ගැනීම උදෙසා එම වාර්තාව, අමාත්‍යාංශය හරහා මහ බැංකුව වෙත යවා ඇත.
	(ඇ)අධිකාරිය විසින් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුනි.	ආයතනික බඳවාගැනීම් පටිපාටිය සකස් වූ පසු කාර්යසාධනය පදනම් කරගත් පුහුණු සැලැස්මක් හා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට පියවර ගනු ලැබේ.
3.1.2	**<u>ක්‍රියාකාරිත්වය හා සමාලෝචනය</u>** (අ)(i) 2008-2012 යන කාලපරිච්ඡේදය තුලදී මිලදී ගෙන තිබූ උපකරන අළුත්වැඩියා කිරීමක් සිදුකර නොතිබුන බැවින් මෙම මිනුම් උපකරණ භාවිතාකර ලබා ගන්නා තොරතුරුවල නිරවද්‍යතාවය හා ගුණාත්මකභාවය පිලිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.	දෝෂ සහිත උපකරන සහ ක්‍රමාංකනය කල යුතු උපකරන හඳුනාගෙන තිබුනු අතර එහිදී දෝෂ සහිත උපකරන අළුත්වැඩියාව සඳහා අදාල උපකරන වල නියොජිතයන් මඟින්ම සිදුකල යුතු අතර සමහර උපකරන වල ක්‍රමාංකනයන්ද විදේශ රටවලින් පමනක් සිදු කල යුතුව ඇත. ඒ සඳහා අධික වියදමක් දැරීමට සිදු වන බැවින් ඒ වෙනුවට එම උපකරන අළුතින් මිලදී ගැනීමට කටයුතු කරමින් පවතී. ඇතැම් උපකරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය මඟින් ක්‍රමාංකනය කර නිරවද්‍යතාවය සහතික කර ඇත.
	(ii)මෙම උපකරණ අතරින් 2017 භාණ්ඩ සමීක්ෂණයෙන් දෝෂ සහිත ලෙස හඳුනාගෙන තිබූ උපකරණ අපහරණය කිරීමට, අලුත්වැඩියා කිරීමට හෝ නවීන උපකරන මිලදී ගැනීමට කටයුතු කර නොතිබුණි.	දෝෂ සහිත උපකරන 2017 වර්ෂයේ දී හඳුනාගෙන ප්‍රසම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබීය. නමුත් ප්‍රසම්පාදනයේදී සිදු වූ ප්‍රමාදය හේතුවෙන් 2017 වර්ෂයේදී එය සිදු කිරීමට නොහැකි විය. 2018 වර්ෂයේදී හඳුනාගත් දෝෂ සහිත උපකරන මිලදී ගැනීමට අවශ්‍ය

		කටයුතු යොදා ඇත.
	(iii)බලශක්ති මිනුම් උපකරණ කුලියට දීමේදී අයකරන ගාස්තු 2010 සිට 2018 දක්වා සංශෝධනයක් සිදුකර නොතිබුණි.	එම උපකරණ භාවිතා කරනු ලබන ආයතන සඳහා සාධාරන මිලකට මෙම උපකරණ ලබා දෙනු ලැබේ.අප ආයතනය බලශක්ති කාර්යක්ෂමතාවය ඉහල නැංවීම අරඹයා මෙම සේවාව පුළුල් කරමින් රටේ බලශක්ති කාර්යක්ෂමතාවය ඉහල නැංවීමට කටයුතු කරමින් සිටී. මෙම කරුණු පදනම්කරගෙන බලශක්ති මිනුම් උපකරණ කුලියට දීමේදී අයකරන ගාස්තු 2010 සිට සංශෝධනයක් සිදුකර නොතිබුණි.
	(iv) බලශක්ති සේවා අංශය තුල නිලධාරීන් දෙදෙනෙන් පමණක් සේවයේ යෙදී සිටීම නිසා සේවා සැපයීම හා උපකරන නැවත භාර ගැනීම ආදී කටයුතු ක්‍රමානුකූලව සිදු කිරීමට අපහසු බව විගණනයේදී නිරීක්ෂණය විය.	සංශෝධනය කරන ලද ආයතන බඳවා ගැනීමේ පටිපාටිය තුලින් ඉදිරියේදී කාර්යමණ්ඩලය සඳහා අවශ්‍ය වන නිලධාරීන් බඳවා ගැනීමට නියමිතය. එමඟින් සඳහන් කරන ලද අඩුපාඩු මඟහරවා ගැනීමට කටයුතු යොදා ඇත.
	(ආ) සූර්ය බලශක්ති ව්‍යාපෘති 3ක් හා සූර්ය බලශක්ති කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති 3 ක් වෙනුවෙන් එකතුව රු.මි.74.787 ක ප්‍රතිපාදන සුනිත්‍ය බලශක්ති අරමුදලින් සලසාගෙන තිබුණද 2017 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘති 4 ක කිසිදු කාර්යක් සිදුකර නොතිබීම හේතුවෙන් මුළු ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණ අතර ව්‍යාපෘති 2 ක සියයට 0.2 සිට 1 කාර්යසාධනයක් පමණක් නිරීක්ෂණය විය.	**<u>RE/03/01 – Study on a Smart Grid</u>** ප්රායෝගික කරුනු සැලකිල්ලට ගැනීමේ දී, මෙම පද්ධතිය පවතින පද්ධතියකට වඩා නව ඉදිකිරීම් සඳහා හඳුන්වාදීම පහසු වේ. නමුත් ස්මාර්ට් ග්‍රිඩ් සිස්ටම් එකක් පවතින පද්ධතියකට අනුගත කිරීම ප්‍රායෝගික වශයෙන් ඉතා සංකීර්ණ කාර්යයක් සිදුකිරීමට ඇති බැවින් මෙය ක්‍රමාණුකූලව සිදුකල යුතු කාර්යක් බව හඳුනා ගන්නා ලදි. **<u>RE/08 – IFC Solar Project</u>** IFC ආයතනය සමඟ කෙටිකාලයක් මෙම ව්‍යාපෘති කටයුතු සිදු කලද එම ආයතනයේ සහයෝගය දීම හදිසියේ නතර වූ නිසා අප වෙන්කල මුදල් ද වියදම් කිරීමට නියමිත කාලයට නොහැකි විය. **<u>RE 10 - Hambanthota Solar Park</u>** හම්බන්තොට ප්‍රදේශයේ පුනර්ජනනීය බලශක්ති උද්‍යානයක් ස්ථාපිත කිරීම සඳහා මුදල් වෙන්කර ගත්තද , ඉඩම් බලශක්ති සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කලද , හම්බන්තොට ඇතිවූ නව සංවර්ධන සැලැස්ම මත අපගේ ව්‍යාපෘති සඳහා කටයුතු කිරීමට නොහැකි විය. **<u>EM/05/02 – Improvement of Energy Utilization Efficiency in Hotel Sector</u>** බලශක්ති කළමනාකරණ අංශයේ ඉංජිනේරු හා අනෙකුත් අය ඉතා සුළු පිරිසක් පමණ සේවය කරන බැවින්ද, වෙනත් කටයුතු, විගණන, උපදේශන සේවා, දැනුවත් කිරීම් ආදී කටයුතු වල යෙදීමත් නිසා මේ සඳහා කාලය සොයා ගැනීමට අපහසු විමෙන් මෙම වැඩසටහන 2017 දී කිරීමට නොහැකි විය. **<u>EM – 06 Development of Standard Withering Trough</u>** මෙම ව්‍යාපෘතිය සඳහා වන අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලැබුනේ 2018 පෙබරවාරි මස වන අතර ඒ සඳහා වන

		අවබෝධතා ගිවිසුම අත්සන් කෙරුනේ 2018 මැයි මාසයේදීය. මෙම කටයුතු කඩිනමින් අවසන් කිරීමට ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ. **ST- 02 Wide Petrol Shed Survey** මෙහි නියදිය නිර්ණය කිරීම සඳහා 2016 වසරේ අවසන් කරන ලද නියමු සමීක්ෂණ දත්ත 186000ක් පමණ විශ්ලේෂණය කල යුතුව තිබිණ. මේ විශ්ලේෂණය පිලිබඳ කටයුතු අවසන් කල හැකි වූයේ 2017 වසරේදීය. එම නිසා එම සමීක්ෂණය එම වසරේදී ක්‍රියාත්මක කල නොහැකි විය. මෙම සමීක්ෂණය ඉදිරි කාලයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇති බව කරුණාවෙන් දන්වමි.
3.2	කළමනාකරණ ක්‍රියාකාරකම් (අ)ආයතනය ප්‍රධාන කාර්යාලයක් ඉදිකිරීම වෙනුවෙන් කල්බදු පදනම යටතේ ඉඩමක් ලබාගෙන තිබුන අතර නීතිමය උපදෙස් ලබාගැනිමකින් තොරව බදු ගිවිසුමකට එළඹ තිබීම හේතුවෙන් වර්ෂ 02 ක් තුළ සංවර්ධන කටයුතු නිම කිරීමට අපොහොසත් වුවහොත් බදු දේපලේ අයිතිය බදුකරුට ලැබෙන බවට කොන්දේසියක් ඇතුලත්ව තිබුනි. එහෙත් 2017 සැප්තැම්බර් 30 දින වන විට වසර 2 1/2 ක් ඉක්ම ගොස් තිබුනද ගොඩනැගිල්ලේ සැලසුම් නිර්මාණ කටයුතු පමණක් සිදු කර තිබුණි.	නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් ලබාගත යුතු අනුමැතීන් ලබාගැනීම සඳහා වසර දෙකක ට ආසන්න කාලයක් වැය විය. එනමුදු 2018 මාර්තු මස මෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භය සනිටුහන් කිරීම පිණිස මුල්ගල් ස්ථාපනය කරන ලදි.
	(ආ)සේවා කාලය වර්ෂ 5 ඉක්මවූ කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබූ සේවකයකු සඳහා විශ්‍රාමික පාරිතෝෂිතය ලෙස රු.160,090 ක් ගෙවා තිබුණද ඒ සඳහා වාර්ෂික වෙන් කිරීම් සිදු කර නොතිබුනි.	අධිකාරිය විසින් වාර්ෂික විශ්‍රාමික පාරිතෝෂිතය ගණනය කරණු ලබන්නේ ස්ථිර සේවයේ නියුතු සේවකයන් ගණනය කිරීමෙනි. සේවයේ අවශ්‍යතාවය මත මෙම නිලධාරියාගේ සේවය අඛණ්ඩව වසර 5 ක් තිබීම හේතු කොටගෙන මෙම නිලධාරියාට විශ්‍රාමික පාරිතෝෂිතය ගෙවීමට ආයතනයට සිදු විය.
	(ඇ)සුනිත්‍ය බලශක්ති අධිකාරියේ ආරම්භයේ සිට සේවක වැටුප් පරිවර්තනය කිරීමේ දී සිදු වූ දෝෂ සම්බන්ධයෙන් සිදුකරන ලද විමර්ශන වාර්තාවට අනුව 2007 ඔක්තෝබර් 01 දින සිට 2011 සැප්තැම්බර් 30 දින දක්වා චක්‍රලේඛවලින් බැහැරව වැඩිපුර ගෙවන ලද රු.2,171,760 ක වැටුප් හා දීමනා අදාල නිලධාරීන්ගෙන් අය කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිළධාරි ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් නියෝග කර තිබුණද, ඒ අනුව අය කර ගැනීමට හෝ නිවැරදි කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.	සුනිත්‍ය බලශක්ති අධිකාරිය ආරම්භයේ සිට සේවක වැටුප් පරිවර්තනය කිරීමේදී සිදු වූ දෝෂ සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිගැනීමට නොහැකි බව තීරණය කර ඇත. නව විමර්ශන කමිටුවක් පත්කර එහි නිර්දේශ මත ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට ආයතනික විගණන හා කළමනාකරණ කමිටුවේදී තීරණය විය.
	(ඈ)2007 සැප්තැම්බර් 28 දින ඇති කර ගන්නා ලද ගිවිසුමකට අනුව මාස 18 ක් ඇතුළත ප්‍රොටොටයිප් විදුලි වාහන තුනක් සංවර්ධනය කිරීම සඳහා 2007 වර්ෂයේ දී බාහිර	මෙම ව්‍යාපෘතිය හා සම්බන්ධ බාහිර පාර්ශව දිගින් දිගටම මෙම කාර්යභාරය මඟහරිමින් සිටින බැවින් ඔවුනට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කොට ඇත. නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි මේ සඳහා

	පාර්ශවයකට රු.7,956,800 ක් ගෙවා තිබුණි . කෙසේ වුවද, 2018 අගෝස්තු 30 දිනදක්වාම එක් වාහනයක් හෝ සංවර්ධනය කිරීමට සංවර්ධකට නොහැකි වී තිබූ අතර වාහන 03 ක් සංවර්ධනය කරවා ගැනීමට හෝ ගෙවන ලද මුදල ආපසු අයකර ගැනීම සඳහා නීත්‍යානුකූල වශයෙන් අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.	බේරුම්කරුවකුගේ සේවය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කොට ඇත.
	<u>සුළං මාපක කුළුණු</u> (ඉ)2012 වර්ෂයට පෙර ස්ථාපිත කරන ලද කුළුණු 6 මගින් ප්‍රමාණවත් දත්ත ලබාගෙන තිබුණද එම දත්ත උපයෝගී කර සුළං බල සම්පත් සිතියම් හා සැලසුම් සකස් කිරීම 2018 අගෝස්තු 31 දින දක්වාම අවසාන කර නොතිබුණි.	සුළං සම්පත් සමීක්ෂණ වැඩසටහන යටතේ සුළං සම්පත් සිතියම සකස් කිරීමේදී, • පළමුව දත්ත එකලස් කිරීම • දත්ත විශ්ලේෂණය • දත්ත ප්‍රමාණයේ පරිදි අනුපිලිවෙල සකස් කිරීම • සිතියම් සකස් කිරීමට අදාළ මුදුකාංග වලට අනුරූප ලෙස දත්ත සකස් කිරීම කල යුතු අතර මේ සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වේ. ප්‍රමාණවත් කාලයකට පසුව සුළං සම්පත් විභව සිතියම සකස් කිරීමට බලාපොරොත්තු වේ. ඒ සඳහා තවත් මාස 08-10 අතර කාලයක් අවශ්‍ය වේ.
	(ඊ) 2010 දෙසැම්බර් 31 දිනට ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු රු. 897,025,999 ක මුදල පියවීමට කිසිඳු වැඩපිලිවෙලක් අධිකාරිය විසින් සකස් කර නොතිබුණි.	මෙම මුදල මගින් විදුලි බලාගාර ක්‍රියාකරුවන්ට පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර යොදා ගනිමින් පිරිවැය පාදක අයක්‍රම මූලධර්ම අනුව සිදුකරන ලද ගෙවීම් සහ සාමාන්‍ය උත්පාදන සංකලනයෙන් විදුලිබල උත්පාදනයේ 90% මගහරවා ගන්නා ලද පිරිවැය අතර වෙනස අදහස් කෙරේ. මහජන උපයෝගිතා කොමිෂන් සභාව මෙම මුදල පාරිභෝගිකයන්වෙතින් අයකිරීමට 2010 වර්ෂයේදී එකග වී ඇත. ඒ සඳහා තවදුරටත් කටයුතු කිරීමට අවශ්‍ය නොවන බව අප ආයතනයේ මතයයි.
3.3	**<u>නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්</u>** (අ) ස්විච් ඒෂියා වැඩසටහන යටතේ ලැබී ඉතිරිව ආපසු ගෙවිය යුතුව තිබූ මුදල් රු.4,548,176 ක්, 2011 වර්ෂයේ රාජ්‍ය බැංකු දෙකක ජංගම ගිණුමක රු. 4,548,176 ක් හා ඉතිරිකිරීමේ ගිණුමක රු.150,000,000 කට වැඩි මුදලක් වසර ගණනාවක සිට තැන්පත් කර තිබුණි.	ස්විච් ඒසියා වැඩසටහන යටතේ ලැබී ඉතිරිව ඇති මුදල් කිසිඳු ආයෝජන කටයුත්තක් සඳහා මේ දක්වා යොදා නොගත්තේ මෙහි මුදල් සම්බන්ධයෙන් කෝප් කමිටුවේ මේ වන විට ප්‍රශ්න කරමින් පවතින නිසාය.
	(ආ) අධිකාරිය සතු කැබ් රථයක් හා මෝටර් බයිසිකලයක් වසර 3 කට අධික කාලයක සිට නිෂ්ක්‍රීයව පවතින අතර ඉහත කැබ් රථය ලංකා ඔටෝ මොබයිල් සංගමය මගින් 2015 ජුනි 17 දිනැති තක්සේරු වාර්තාව මගින් අපහරණය කිරීමට නිර්දේශ කර තිබුණි. නමුත් මෙම වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට 2018 අගෝස්තු 30 දින දක්වාම අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර කැබ් රථය එළිමහන්	එම කැබ් රථය අපහරණය කිරීමට 2018.02.27 දින ආයතනික ප්‍රසම්පාදන අංශය වෙත යොමු කර ඇත. මේ සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත් කර ඇති අතර එම කමිටුවේ වාර්තාව ලැබීමෙන් අනතුරුව ඉදිරි වැඩ කටයුතු සිදු කරනු ලැබේ.

	ස්ථානයක දිරාපත් වෙමින් පවතින බව නිරීක්ෂණය විය.	
	(ඇ)ප්‍රතිස්ථාපනය කිරීමේ නිර්දේශය මත ගලවා ඉවත් කරන ලද සාම්පූර් හා මුල්ලිපුරම සුළං මාපක කුළුණු කිසිදු ගිවිසුමක් නොමැතිව සේවා සැපයුම්කරු වන අශෝක කන්ස්ට්‍රක්ෂන් ආයතනය සතු කැප්පෙට්වලානේ පිහිටි පරිශ්‍රයකට ප්‍රවාහනය කර තිබූ අතර එම කුළුණු වලින් ගලවා ඉවත් කරන ලද උපකරණ අධිකාරිය වෙත භාරදුන් බවට කිසිදු ලේඛණයක් නොමැතිව සේවා සැපයුම්කරුට මුදල් නිදහස් කර තිබුණි. ගලවා ඉවත් කරන ලද දේපල නැවත භාවිතයට ගැනීමට හෝ සුදුසු පරිදි කටයුතු කිරීමට 2018 අගෝස්තු මස දක්වාම අධිකාරිය අපොහොසත් වී තිබුණි.	සේවා සැපයුම්කරුගේ පරිශ්‍රයේ කළුණු වල කොටස් අපේ අධීක්ෂණය යටතේ සුරැකිව තබා ඇත. ඒවාට කිසිදු ගෙවීමක් නොකරන අතර ඉවත් කල උපකරණද බොහොමයක් නැවත නැවත පාවිච්චි කිරීමට නොහැකි නමුත් ඒවා අධිකාරිය සතුව තිබේ.
	(ඈ)නාඩුකුඩා සුළං මාපක කුළුණ සඳහා 2016 පෙබරවාරි මාසයේදී මිලදී ගත් රු. 1,775,025 ක වටිනාකමින් යුත් උපකරණ අතරින් රු. 915,625 ක් වටිනා උපකරණ 2018 අගෝස්තු මස දක්වාම භාවිතයට ගෙන නොතිබුණු අතර අනෙකුත් උපකරණ මාස 11 ක් පමණ ප්‍රමාද වී සවි කර තිබුණි.	මෙම උපකරණ විදේශ රටවලින් මිලදී ගැනීමට සිදු වී තිබෙන නිසා කාලය ගතවී ඇත. අත්‍යවශ්‍ය උපකරණ ලෙස රු. 915,625 ක උපකරණ නඩුකුඩා සුළං මාපක කුළුණේ සවි කර ඇති අතර අනිත් උපකරණ අවශ්‍යතාවය අනුව සවි කිරීමට අධිකාරිය සතුව පවතී.
3.4	කාර්ය මණ්ඩල පරිපාලනය (අ) අධිකාරිය සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් සකස්කර අනුමත කරගෙන නොතිබුණි.	බඳවා ගැනීමේ පටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියට යවා ඇත. මේ වන විට එය සංස්කරණය වෙමින් පවතී.
	(ආ)අධිකාරිය සඳහා අනුමත කරන ලද කාර්ය මණ්ඩලය 136 ක් වූ අතර 2017දෙසැම්බර් 31 දිනට සත්‍ය කාර්ය මණ්ඩලය 103 ක් විය. ඒ අනුව පුරප්පාඩු 33 ක් පැවති අතර මෙම පුරප්පාඩු අතර අධ්‍යක්ෂ තනතුරු 3 ක්, අංශ ප්‍රධාන තනතුරු 4 ක් හා කළමනාකරණ තනතුරු 12 ක් ද විය.	අනුමත බඳවා ගැනීමේ පටිපටියක් නොමැති බැවින් ආයතනික බඳවා ගැනීම් කටයුතු තාවකාලිකව නවතා ඇත. නව බඳවා ගැනීමේ පටිපාටිය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීමෙන් පසුව කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා යොමු කරනු ලැබේ.
	(ඇ) ඉහත පරිදි පුරප්පාඩු වූ අධ්‍යක්ෂවරුන් තිදෙනා සහ අංශ ප්‍රධානීන් 4 න් 3 ක් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ නියමයන්ගෙන් බැහැරව නිත්‍ය තනතුරේ පත්කිරීම් බලධාරියා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව අධිකාරියේ සභාපතිවරයා විසින් 2013 හා 2014 වර්ෂයන්හී දී වැඩ බැලීමේ තනතුරු සඳහා පත් කිරීම් සිදු කර තිබුණි.2013 සිට 2017 දක්වා වැඩ බැලීමේ දීමනා ලෙස රු.2,903,361 ක් ගෙවා තිබුණි.	මෙම පත්කිරීම් සහය සේවා අංශ ප්‍රධානී, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පරිපාලන අංශය භාරව කටයුතු කළ) හා අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය සහිතව එවකට අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රධානී සභාපතිතුමන් විසින් සිදුකර ඇත. වැඩ බැලීම් පත්වීම් දීර්ඝ කිරීම් සිදුකර ඇත්තේ අනුමත බඳවා ගැනීමේ පටිපාටියක් අනුමත වී නොමැති බැවින් ස්ථිර පත්වීම් ලබාදිය නොහැකි නිසාය. ඒ අනුව මේ වන විටත් ආයතනික බඳවා ගැනීමේ පටිපාටිය අනුමත වී නොමැති බැවින් එම වැඩ බැලීමේ පත්වීම් ස්ථිර කිරීමේ හැකියාවක් නොපවතී.
	(ඈ) තවද අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් ද තොරව අධිකාරියේ වැඩ බැලීමේ තනතුරු 06	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුව මෙම වැඩ බැලීමේ

	සඳහා 2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා ඉන්ධන දීමනා ලෙස රු. 2,610,880 ක් ද, අංශ ප්‍රධානී තනතුරු 03 හි අධ්‍යක්ෂවරයෙකු වෙනුවෙන් ප්‍රවාහන දීමනා වශයෙන් 2015 සිට 2017 වර්ෂය දක්වා රු. 4,210,000 ක් ද ගෙවා තිබුණි.	පත්වීම් ලබා දී ඇති නිලධාරීන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති බැවින් බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කළ වහාම බඳවා ගැනීම් පටිපාටියට අනුව ස්ථිර පත්වීම් ලබා දී වැඩ බැලීමේ දීමනාව අවලංගු කිරීමට කටයුතු කරනු ලැබේ. තවද වැඩබැලීම් සඳහා පත්කළ නිලධාරීන්ගේ තිදෙනෙකු HM-1-1 වැටුප් කේතයට අයත්වන අතර ඔවුනට 2015/05/25 දින සිට චක්‍රලේඛ අංක PED/1/2015 මගින් නිල වාහනයක් වෙන් කිරීම හා අදාල ඉන්ධන දීමනාව අනුමත කර ඇත. ඒ අනුව වැඩ බැලීමේ පදනම මත වාහන වෙන්කර ඇත්තේ නිලධාරීන් දෙදෙනෙකු සඳහා පමණි.
	(ඉ) සුළං මාපක කුළුණු නඩත්තු කිරීම, කුළුණු මඟින් දත්ත එකතු කිරීම, මෘදුකාංග මඟින් දත්ත සකස් කිරීම හා ලිපිගොනු පවත්වාගෙන යාම යනාදී සියලු කාර්යයන් 2017 වර්ෂය ආරම්භයේ සිටම එක් තාක්ෂණික නිලධාරියෙකුට පමණක් සීමා වීම නිසා 2017 වර්ෂය සඳහා සැලසුම් කළ කාර්යසාධන ඉලක්ක ළඟා කරගැනීමට අපොහොසත් වී තිබූ අතර එය අනාගත කාර්ය සාධනය කෙරෙහිද අහිතකර ලෙස බලපෑමේ අවදානමක් පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.	2017 වසරේ දත්ත ප්‍රතිශතයක් ලෙස සැකසීම සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍යවේ. මෙම කාර්ය සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති අතර 2016 සිට ආයතනයේ බඳවා ගැනීමේ පටිපාටිය සැදෙන බැවින් මෙම කියාවලිය සඳහා මිනිස් ශ්‍රමය ලබාගත නොහැකි මට්ටමක් ඇත.
4 4.1	**<u>තිරසාර සංවර්ධනය</u>** එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසර සංවර්ධන අරමුණු හා අදාලව දැරිය හැකි සහ පිවිතුරු බලශක්ති සැපයුම සම්බන්ධයෙන් “2030” න්‍යාය පත්‍රයට අනුව ඉලක්ක හඳුනාගැනීම් හා එම ඉලක්ක ඉටුකරගැනීම් අතර විචලනයන් හා ප්‍රගතිය මැනීමේ සුදුසු නිර්නායක ක්‍රියාකාරී සැලැස්ම තුලින් හඳුනාගෙන නොතිබුණි.	එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන අරමුණු ළඟාකරගැනීම සඳහා බලශක්ති සංරක්ෂණය හා පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය යන ක්‍රියාදාම දෙකම වැදගත්වේ. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන සමස්ථ ව්‍යාපෘතීන් හා වැඩසටහන් එම ක්ෂේත්‍ර දෙක ආවරණය වනසේ සිදුකරන නිසා, ආයතනය මගින් සිදුකරන සියලුම වැඩසටහන් තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම සඳහා දායක වනු ඇත.
5.1	**<u>ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය</u>** (අ)අධිකාරිය ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමේ දී ආයතනයේ අවශ්‍යතාවයන් ඉක්මවා ඇස්තමේන්තු සකස්කර තිබූ බව නිරීක්ෂණය විය.	ප්‍රසම්පාදන සැලසුම පිලියෙල කරනු ලැබුවේ ආයතනයේ ක්‍රියාකාරී සැලැස්මට අනුවය. එම සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය අනෙකුත් සාධක වල ඌණතා නිසා එම සැලැස්ම පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බැවින් මෙම ඌනයෝජනය සිදු වී ඇත. මෙම තත්වය සලකා බලා සැලසුම් පිලියෙල කිරීමට මින් ඉදිරියට කටයුතු කරන බව කරුණාවෙන් දන්වමි.

	(ආ) ප්‍රසම්පාදන සැලැස්මේ දී කාල රාමුවන් හඳුනාගෙන තිබුණ ද එම කාල සීමාවන් තුල ක්‍රමානුකූලව ප්‍රසම්පාදනයන් සිදු වී නොතිබුණි.	ආයතනයේ පූර්ණ ධාරිතාවය සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාව බඳවා ගැනීමට නොහැකි වී ඇත. ඒ නිසා කාලානුරූපව සැලසුම් ක්‍රියාත්මක කිරීමට උග්‍ර ගැටළු පැන නැගී ඇත. බඳවාගැනීමේ පටිපාටියට අනුමැතිය ලැබී සේවක සංඛ්‍යාව අවශ්‍ය තරමට වර්ධනය වූ පසු මෙම තත්වය නිවැරදි වනු ඇති බව කරුණාවෙන් දන්වමි.
	(ඇ) 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව සැපයුම් 50 සිදු කිරීමට සැලසුම් සකස් කර තිබුණද සැපයුම් 6 ක් පමණක් සිදුකර තිබුණි.	අධිකාරිය විවිධ ක්ෂේත්‍ර ගණනාවක් හරහා සේවා සම්පාදනය කරන නිසා විවිධ ආයතනයන්, අමාත්‍යාංශ හා වෙනත් පාර්ශව විසින් යොමු කරවන්නා වූ වැඩසටහන් වලට යොමු වීමට සිදු වී ඇත. මෙම කාර්යන් වසර එළඹීමට පෙර පිලියෙල කරනු ලබන වාර්ෂික සැලැස්මක හෝ ප්‍රසම්පාදන සැලසුමක අන්තර්ගත කිරීම උගහටය. මෙම පරිභාහිර ක්‍රියාකාරකම් පාලනය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව කරුණාවෙන් දන්වමි.
6	<u>**පද්ධති හා පාලනයන්**</u> (ආ) පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ. ගිණුම්කරණය, මූල්‍ය පාලනය, ණයගැති පාලනය, මානව සම්පත් කළමනාකරණය, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, වත්කම් කළමනාකරණය, තොරතුරු පද්ධති කළමනාකරණය, වාහන පාලනය	විගණකාධිපතිතුමා විසින් පෙන්වා දී ඇති කේෂ්ත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් අදාල දූර්වලතාවයන් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.

<u>**විගණන විමසුම් හා විගණන වාර්තාවල අඩංගු අඩුපාඩු නිවැරදි කර ගැනීමට ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග-2019.06.28 දින විගණකාධිපති වාර්තාව**</u>

විගණන යොමු අංකය	2017 විගණන වාර්තාව අනුව දක්වා ඇති කරුණ	ඒ සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග
2.2.1	<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u> සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	මෙය ආයතනයේ සේවකයන්ගේ හිඟකම මත සිදු වූවක් වන අතර, මූල්‍ය අංශයේ ප්‍රධානියෙකු නොමැති බව ප්‍රධාන වශයෙන් බලපෑ හේතුවක් විය. නිවැරදි අනුමැතීන් සහිත මූල්‍ය ප්‍රකාශන 2019 ජනවාරි 17 දින විගණකාධිපති තුමා වෙත යොමු කර ඇත.

2.2.2	සම්පූර්ණයෙන් ක්‍ෂය කරන ලද නමුත් තවදුරටත් පරිහරණය කල හැකි දේපල පිරියත උපකරණ සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණ අතර ඇස්තමේන්තුගත දෝශයක් වෙනම් ඒවා නිවැරදිකර වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ට අනුව සම්පූර්ණයෙන් ක්‍ෂය කරන ලද නමුත් තවදුරටත් පරිහරණය කල හැකි දේපල පිරියත උපකරණ වල දල ධාරණ අගය ගණනය කරමින් පවතින අතර 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල එය ඉදිරිපත් කිරීමට කටයුතු කරමින් පවතී.
2.2.3	**(අ) (i)** ඉඩම බදු ගැනීම වෙනුවෙන් බලශක්ති අරමුදලින් ලබා ගත් රු. 47,000,000 ක මුදල අයභාර ලැබීමක් ලෙස හඳුනාගෙන 2015 වර්ෂයේ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයෙහි ගිණුම් ගත කර තිබීම හේතුවෙන් එම වර්ෂයේ අතිරික්තය රු. 47,000,000 කින් අධිගණනය වී තිබුණි.	2015 වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය අධි තක්සේරු වූ අගය වන රු. 47,000,000 නිසි පරිදි ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය හරහා ඉදිරි මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයට ගැලපුම් කිරීමට කටයුතු සිදු කරමි.
	(ii) අස්පෘශ්‍ය වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් දරන ලද රු. 8,345,683 වෙනුවට රු. 9,242,483 ක් අඩුකර ඉතිරි රු. 41,247,949 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට බැර කිරීම හේතුවෙන් රු. 896,800 අඩුවෙන් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය බැර වී තිබුණි. එම නිසා 2016 වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් ගිණුම්ගතවී තිබුණි. එය සමාලෝචිත වර්ෂයේදීද නිවැරදිකර නොතිබුණි.	2018 වර්ෂයේ අවසාන ගිණුම් සඳහා එම අතපසු වීම නිවැරදි කිරීමට කටයුතු සිදුකිරීමට බලාපොරොතු වේ.
	(ඇ)ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතියක් සඳහා නිකුත් කරන ලද රු. 51,800,357 ක් වු ණය, අයකරගැනීමේ වගකීම අධිකාරියට පවරා නොතිබියදී අධිකාරිය විසින් ලබා ගත් ණයක් ලෙස ජංගම නොවන බැරකම් යටතේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණි.	මෙම ව්‍යාපෘතිය යටතේ නිකුත් කරන ලද ණය 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලින් ඉවත් කිරීමට කටයුතු යොදා ඇත.
	ඉ) ආසියානු සංවර්ධන බැංකු ණය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතීන් සඳහා වෙනම ව්‍යාපෘති ගිණුම් පිලියෙල කලද ඊට අදාල අදායම් හා වියදම් අධිකාරියේ ආදායම් ප්‍රකාශනයේ ගිණුම්ගතකර තිබුණි.	ව්‍යාපෘති වලට අදාල අදායම් හා වියදම් ද විගණකාධිපතිවරයා පෙන්වා දී ඇති පරිදි අදායම් ප්‍රකාශයෙන් ඉවත් කිරීමට කටයුතු යොදා ඇත.
	ඊ) සමාලෝචිත වර්ෂයේ ක්ෂය ප්‍රතිපාදන කිරීමේදී අධිකාරියේ ක්ෂය ප්‍රතිපත්තියෙන් බැහැරව කටයුතුකර තිබුණි.	2017 වර්ෂය සඳහා ක්ෂය ප්‍රතිපාදන කිරීමේදී ආයතනයේ පූර්ණ වර්ෂයන් හී ලබා ගත් ක්ෂය ප්‍රතිපාදනය කල යුතු වත්කම් පිළිබද තොරතුරු ලබා ගැනීමට ඇති අපහසුතාවය මත පෙර වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට හඳුනාගත් ක්ෂය ප්‍රතිපාදන මත පදනම්ව ක්ෂය ගණනය කිරීමක් සිදුකරන ලදී. ආයතනයේ වත්කම් ලේඛනය යාවත්කාලීන කිරීම සිදුකරන බැවින් මෙය 2019 වර්ෂය වනවිට ක්‍රමානුකූල තත්වයට පත්වනු ඇත.
	උ) බලශක්ති අරමුදලට හා ඇප අරමුදල වෙත බැර කල යුතු ආදායම් හා පොලී ආදායම් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුලත් කිරීම නිසා අතිරික්තය රු. 37,504,984කින් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.	එම හඳුනා ගත මුදල නිවැරදි ලෙස ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය හරහා බලශක්ති සංරක්ෂණ අරමුදල හා ඇප අරමුදල වෙත බැර කර ඇත. නිවැරදි පරිදි පොලී ආදායම වෙනත් ආදායම් යටතේ ආයතනයේ ආදායම් ප්‍රකාශයට/ මූල්‍ය කාර්ය ප්‍රකාශයට ලබාගත යුතු වේ.

2.3	**පැහැදිලි නොකළ වෙනස්කම්** ඇප අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය හා එදිනට ආයෝජනයේ ශේෂය අතර රු. 372,333 ක පැහැදිලි නොකල වෙනසක් නිරීක්ෂණය විය.	විගණන වාර්තාවේ පැහැදිලි නොකළ වෙනස්කම් යටතේ දක්වා ඇති ඇප අරමුදලේ ශේෂය හා ආයෝජන ශේෂය අතර පවතින රු. 372,333.00 ක වෙනස 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දී නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.
2.4	**ලැබිය උතු සහ ගෙවිය යුතු ගිණුම්** අ)කලාප අධ්‍යාපන වැඩසටහන් සඳහා 2016 දී රු. 13,348,087 ක් අත්තිකාරම් ලබා දී තිබූ අතර එයින් රු. 6,882,412 ක අත්තිකාරම් 2017 දෙසැම්බර් 31 දක්වාම පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම අත්තිකාරම් මුදල් පියවීම සඳහා අදාල ආයතන වලට ලිපි යොමු කර ඇත.
	ආ) වෙනත් ගෙවීම් හා උපචිත වියදම් ගිණුම්වල දිගු කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින මුදල් නිරවුල් කිරීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි.	වසර 5 කට වඩා වැඩි වෙනත් ගෙවීම් හා උපචිත වියදම් සඳහා සැපයුම්කරුවන් වෙත සත්‍යාපන ලිපි යවා ඇති අතර, එම මුදල් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී.
2.5	**නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට අනුගත නොවීම** අ) (i) ස්ථාවර වත්කම් සඳහා ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණි.	භාණ්ඩාගාර චක්‍රලේඛ අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කරමින් පවතී.
	(ii) චක්‍රලේඛන ප්‍රකාරව පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.	පරිගනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යනු ලැබේ.
	(ආ) මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	2019 මූල්‍ය ප්‍රකාශන සමග කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් විගනකාධිපති තුමා වෙත යොමු මෙම අතපසුවීම් හා මගහැරීම නිවැරදි කරලීමට කටයුතු කරනුලැබේ.
3.1	**මූල්‍ය සමාලෝචනය** සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.51,702,295 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු 6,463,693 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.45,238,602 ක වැඩි වීමක් නිරීක්ෂණය විය.මෙම වාර්තාවේ 2.1.3(එ) ඡේදයේ දක්වා ඇති එකතුව වටිනාකම රු.37,504,984 ක් වූ වැරදි ගිණුම්කරණය මෙලෙස මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් පෙන්වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන් සඳහා පොලී අදායම ලෙස රු.37,504,984 ක මුදලක් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුලත් කර ඇති අතර, නිවැරදි පරිදි පොලී ආදායම වෙනත් ආදායම් යටතේ ආයතනයේ ආදායම් ප්‍රමාණය මූල්‍ය කාර්ය ප්‍රකාශයෙහි දක්වා ඇත. මන්ද යත් එය ආයතනයේ ක්‍රියාකාරකම් හරහා ආයතනයට වර්ෂය තුල ලැබිය යුතු පොලී ආදායම බැවිනි.
4	**මෙහෙයුම් සමාලෝචනය** කෙරීගෙන යන වැඩ යටතේ දක්වා ඇති ක්‍රියාකාරකම් 10 න් රු.15,948,876 ක් වටිනා ක්‍රියාකාරකම් 8 ක් වර්ෂ කිහිපයක සිට ක්‍රියාත්මක නොවන බව හා ඒ සඳහා 2017 වර්ෂයේදීද කිසිදු වියදමක් දරා නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.	අදාල ව්‍යාපෘති 8 න් 5 ක් මේ වන විට සම්පූර්ණ කර ඇත.
5	**අයවැය ලේඛනමය පාලනය** අයවැය ලේඛනය ඵලදායී කලමණාකරන පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.	විගණකාධිපතිතුමා විසින් පෙන්වා දී ඇති පරිදි අයවැය ලේඛනය මූලික කරගත් මූල්‍ය පාලනයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රමවේදයක් සකස් කොට 2019 වර්ෂයේ සිට කටයුතු කරනු ලැබේ.

6	**පද්ධති හා පාලනයන්** විගනනයේදී නිරීක්ෂණය වූ ගිණුම්කරණ , පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.	විගණකාධිපතිතුමා විසින් පෙන්වා දී ඇති ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් ඒවා අදාල අරමුණු පරමාර්ථ ඉටු කර ගැනීම යොමු කිරීමටත් අදාල දූර්වලතාවයන් හඳුනාගෙන ඒවා නිවැරදි කිරීමටත් පියවර ගනු ලැබේ. මෙහි සඳහන් පරිගණක ලෙජර් ක්‍රමය හඳුන්වා දී ඇති අතර, 2019 වසරේ සිට එමගින් ගිණුම් කටයුතු සිදු කෙරේ.

ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග පිළිබඳ සාරාංශයක්

3.1 බලශක්ති බලපත් ලබා දීම පහසු කරලීම උදෙසා භූගෝලීය තොරතුරු පද්ධතිය යාවත්කාලීන කිරීම.

ශ්‍රී ලංකාව සතු පුනර්ජනනීය බලශක්ති ප්‍රභව හටගන්නා ස්ථාන, කාල වකවානු සහ ඒවායේ පරිමාණයන් මිණුම් ගතකර සංවර්ධකයින්ට ආයෝජන අවස්ථා සලසා දීම අධිකාරියේ ප්‍රමුඛ පරමාර්ථයකි. එවැනි, මෙතෙක් සපයාගෙන ඇති සියළු දත්ත සහ තොරතුරු මහජනතාවගේ දැනගැනීම පිණිස අන්තර්ජාලය හරහා ලබා ගත හැකි භූගෝලීය තොරතුරු පද්ධතියකට යොදවා ඇත.

3.2 බලශක්ති සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම.

ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති ප්‍රභව විවිධ ප්‍රදේශ වල හටගන්නේ වුව ද ඒ සෑම ප්‍රදේශයක්ම සංවර්ධනය කිරීමට නොහැකිව ඇත්තේ අනෙකුත් ඉඩම් පරිහරණ කටයුතු නිසාවෙනි. බලශක්ති සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත්කිරීමෙන් වෙනත් ඉඩම් පරිහරණ කටයුතු සඳහා ගැටළු ඇති නොවන බිම් කොටස් පුනර්ජනනීය බලශක්ති සංවර්ධනයට යෙදවීමට මග සැලසෙනු ඇත.

3.3 ශ්‍රීලංකාව තුළ බලශක්ති භාවිතය පිළිබඳව දත්ත ප්‍රකාශයට පත්කිරීම.

වර්ෂ 1971 සිට රට තුළ භාවිතා වන විවිධ බලශක්ති ප්‍රභවයන් පිළිබඳ සියළු දත්ත සහ තොරතුරු එක් රැස් කොට සකසන ලේඛනය ජාතික බලශක්ති ගිණුම හෙවත් බලශක්ති තුළිතය ලෙස හැඳින්වේ. මෙම ක්‍රියාවලිය 1990 දශකයේ සිට ඉටු කරන්නේ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියයි. මේ වන විට යම් වසරක බලශක්ති භාවිතය පිළිබඳ එකී ලේඛනය අන්තර්ජාලයට අනුබද්ධ දත්ත ගබඩාව ලෙස මෙන්ම මුද්‍රිත ප්‍රකාශනයක් ලෙස ද වසරක් තුළ දී ප්‍රකාශයට පත් කිරීමට අධිකාරිය සමත් වී ඇත.

3.4 සුළං හා සූර්ය ශක්තිය මිනුම් ගත කිරීම සහ ඒ හරහා සංවර්ධනය කළ හැකි ප්‍රදේශ හඳුනා ගැනීම.

ශ්‍රී ලංකාව සතු ප්‍රධානතම පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ලෙස සූර්ය බලශක්තිය හා සුළං බලශක්තිය හඳුනාගෙන ඇතත් එකී ප්‍රභවයන්ගේ විචලතාවයන් සහ කාලීන වෙනස්වීම් වටහා ගැනීමකින් තොරව එකී ප්‍රභව සංවර්ධනය කිරීම උගහටය. එම නිසා මෙම ප්‍රභවයන්ගේ ස්වරූපය මිණුම් ගත කිරීම සඳහා රට පුරා ව්‍යාප්ත වූ දීර්ඝ කාලීන කුළුණු ජාලයක් පිහිටුවා සංවර්ධකයන් සඳහා එම දත්ත ලබාදීමට කටයුතු කෙරේ.

3.5 බලශක්ති භාවිතා කරන උපකරණ සඳහා බලශක්ති ලේබල් ලබා දීම වෙනුවෙන් අවශ්‍ය රෙගුලාසි පැනවීම.

යම් විදුලි උපාංගයක කාර්යක්ෂමතාවය සහ ප්‍රමිතිය පිළිබඳ සංකීර්ණතාව පාරිභෝගික ජනතාව වෙත පහසුවෙන් සන්නිවේදනය කිරීම සඳහා බලශක්ති ලේබල්, CFL විදුලි පහන් සඳහා හඳුන්වා දී ඇත. සීලින් පංකා ද්විත්ව විලි සහිත නලාකාර ප්‍රතිදීප්ත පහන් සහ තුලබරු සඳහා එය ලබාදීමට අවශ්‍ය මූලික කටයුතු නිමකර ඇත.

3.6 බලශක්ති භාවිතා කරන උපකරණ වල බලශක්ති කාර්යක්ෂමතාව මැන බැලීම උදෙසා විද්‍යාගාරයක් ස්ථාපිත කිරීම.

බහුල වශයෙන් භාවිතා වන විදුලි උපාංග වල කාර්යක්ෂමතාවය සහ අනෙකුත් ප්‍රමිතීන් හඳුනා ගැනීම සඳහා විවිධ පරීක්ෂණයන් සිදු කිරීමට පර්යේෂණාගාර රැසක් ඉදිකොට ඇත. මෙම පර්යේෂණාගාර විශ්වවිද්‍යාල මෙන්ම වෙනත් රාජ්‍ය ආයතන ආශ්‍රිතව ද ක්‍රියාත්මක වේ.

3.7 බලශක්ති කළමණාකරුවන් සහ බලශක්ති විගණකවරුන් පුහුණුකිරීම.

අධිකාරියේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන තාක්ෂණික සේවා ලබාදීමට එම වෘත්තිකයන් රැසකගේ සේවය ශ්‍රී ලංකාවට ලබා දීමට මෙම පුහුණු කටයුතු සිදු වේ.

3.8 වරලත් බලශක්ති විගණකවරුන් පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.

බලශක්ති පරිභෝජනය කරන ආයතන අනිවාර්ය බලශක්ති විගණනයකට ලක් කිරීම සඳහා ඇති පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා මෙම වරලත් විගණක වරුන් රැසකගේ සේවය අවශ්‍ය වන බැවින් කණ්ඩායම් වශයෙන් ඔවුන්ගේ පුහුණු කටයුතු අඛණ්ඩව සිදු කෙරේ.

3.9 තාක්ෂණ මට්ටමේ අධ්‍යන සඳහා විකල්ප බලශක්ති විෂය නිර්දේශ සම්පාදනය කිරීම.

බලශක්ති සවිඥානික දේශයක් නිර්මාණය කර ගැනීමේ දී සුනිත්‍ය බලශක්ති සම්පත් මෙන්ම එහි භාවිතය පිළිබඳව අනාගත පුරවැසියන් දැනුමෙන් සන්නද්ධ කිරීම මෙහි අරමුණයි.

3.10 පාසල් විෂය නිර්දේශය සඳහා බලශක්ති විෂය හඳුන්වා දීම සහ පාසල් බලශක්ති සමාජ ඇති කිරීම.

බලශක්ති භාවිතය පිළිබඳ සංකීර්ණ කරුණු මෙන්ම ප්‍රායෝගික අත්දැකීම් සාක්ෂාත් කර ගැනීමට ශිෂ්‍ය ප්‍රජාව නැඹුරු කර ගන්නා වැඩසටහනකි.

3.11 විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන වල බලශක්තිය සම්බන්ධ පර්යේෂණ කටයුතු ඉහළ නැංවීම සඳහා සහය වීම.

ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක විශ්වවිද්‍යාල අධ්‍යයන ආයතන සහ අනෙකුත් පර්යේෂණ ආයතන බලශක්තිය පිළිබඳ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා යොමු කිරීම සහ

ක්ෂේත්‍රයේ ජාතික ප්‍රමුඛතාව වෙනුවෙන් එම ආයතන සූදානම් කිරීම ද මෙහි අරමුණයි.

3.12 කුඩා කර්මාන්ත වල තත්ත්වය ඉහළ නැංවීම සඳහා බලශක්තිය ආශ්‍රිත වැඩිදියුණු කිරීමේ ක්‍රියා මාර්ග හඳුන්වාදීම.

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයේ ප්‍රධාන ප්‍රවාහය සේ සැලකෙන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයා ගේ ඵලදායීතාව පිළිබඳ ආකල්ප වෙනස් කිරීම මෙහි අරමුණයි.

3.13 බලශක්ති අධ්‍යාපන වැඩසටහන සංවර්ධනය කිරීම.

2016 වසරේදී කලාප, පළාත් හා ජාතික මට්ටම් ඇගයීමේ ප්‍රගතිය සමාලෝචනය කර, සංවර්ධනය කළ වැඩසටහන ඉදිරියේදී ක්‍රියාත්මක කරනු ඇත.